# ග්‍රාමීය දරිද්‍රතාව අවම කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනයේ කාර්යභාරය පිළිබඳ විමසීමක්

(කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරෙන්)

දිසානායක මුදියන්සේලාගේ රූපාවති මැණිකේ
විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධි
පශ්චාත් උපාධි අධ්‍යාපන
ඩිප්ලෝමා (විශිෂ්ඨ සම්මාන)

UCLIB
517502

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ
නිබන්ධනය

2002

## සංක්ෂේපයෙන්..............


මෙම පර්යේෂණ අධ්‍යයනය 'ග්‍රාමීය දරිද්‍රතාව අවම කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනයේ කාර්යභාර විමසීමක්' නමින් කුරුණෑගල දිස්ත්‍රික්කය කේන්ද්‍රය කරගනිමින් ඉටු කරන්නට යෙදුනි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ 29 කි. මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 65 කට වඩා දිළිඳු සහන හිමිකම් ලබන ප්‍රතිලාභීන් සිටින ගල්ගමුව, මහව, ගිරිබාව, පොල්පිතිගම, කොටවෙහෙර සහ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ පහත සඳහන් අරමුණු යටතේ අධ්‍යයනයට ලක්කර ඇත.

I. ග්‍රාමීය දරිද්‍රතා ලක්ෂණ හඳුනාගැනීම.

II. තෝරාගත් ප්‍රදේශවල අධ්‍යාපන ව්‍යාප්තිය සහ පහසුකම් පිළිබඳ සොයා බැලීම.

III. දරිද්‍රතා ලක්ෂණ හා අධ්‍යාපන මට්ටම් අතර සම්බන්ධතාවයක් තිබේදැයි විමසා බැලීම.

IV. දරිද්‍රතාව පිටුදැකීම සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වය විමර්ෂණය කිරීම.

V. තෝරාගත් පාසල් වල, කොතෙක් දුරට දරිද්‍රතා ලක්ෂණ විද්‍යාමාන වන්නේදැයි සොයා බැලීම.

VI. දරිද්‍රතාව අවම කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනයෙන් කළ හැකි මෙහෙය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම.

යනාදියයි. මෙහිදී සමස්තයක් වශයෙන් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ තුල දරිද්‍රතා ලක්ෂණ හඳුනාගෙන ඇත. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයකින් ඒක් ගමක් බැගින් ගම් 6 ක දරිද්‍රතා ලක්ෂණ හා අධ්‍යාපනික ව්‍යාප්තිය පිළිබඳ දත්ත හා තොරතුරු ඉදිරිපත් කර ඇත. එහිදී සියඹලෑව, කුඹුක්වැව, කොක්මඩුව, තෙළඹියාව, කුඩාමිතව, සහ රන්තැටිකන්ද යන ගම් අධ්‍යයනයට ලක් කෙරුණි. එසේම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ නියෝජනය වන පරිදි කු/ගල්/ සියඹලෑව ප්‍රාථමික විද්‍යාලය, කු/ම/තම්මිටගම මහා විද්‍යාලය, කු/ගි සිද්ධාර්ථ ප්‍රාථමික විද්‍යාලය, කු/නික/ කුඩාමිතව ප්‍රාථමික විද්‍යාලය, කු/පො/ පොතුවැපිටිය කණිෂ්ඨ විද්‍යාලය හා කු/රිදී/ තිලන්තට්ටුව කණිෂ්ඨ විද්‍යාලය යන පාසල් තුල කොතෙක් දුරට දරිද්‍රතා ලක්ෂණ විද්‍යාමාන වන්නේදැයි විමසීමට ලක්කර ඇත.

මෙහිදී සම්මුඛ සාකච්චා, ප්‍රශ්නාවලී, ලිඛිත තොරතුරු හා වාර්තා මගින් දත්ත රැස්කරගෙන ඇති අතර ; එම දත්ත විස්තරාත්මක වාර්තා, වගු, ප්‍රස්ථාර, හා ප්‍රතිශත ඇසුරෙන් විශ්ලේෂණය හා අර්ථකතනය කර ඇත. පලමුවන පරිච්ඡේදයේදී ; ලෝක

දරිද්‍රතාව, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව, දරිද්‍රතාව හා අධ්‍යාපනය අතර සම්බන්ධතාව, අධ්‍යාපනය හා ආර්ථික සංවර්ධනය පිළිබඳ කරුණු විමර්ෂනයට ලක්කර ඇත. දෙවන පරිච්ඡේදයේදී දරිද්‍රතාව පිළිබඳ දේශීය හා විදේශීය පර්යේෂණ සාහිත්‍යමය හෙළිදරව් කිරීම් පිළිබඳ අවදානය යොමු කර ඇත. තුන්වන පරිච්ඡේදයේදී ; පර්යේෂණ ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳ විස්තරාත්මක වාර්තා සපයා ඇත.

හතරවනවන පරිච්ඡේදයේදී අධ්‍යයනයට ලක්කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ගම් හා පාසල් පිළිබඳව තොරතුරු හා දත්ත; විශ්ලේෂණය හා අර්ථකතනය කර ඇත. පස්වන පරිච්ඡේදයේදී දත්ත විශ්ලේෂණ තුළින් නිගමන වලට එළඹී ඇති අතර; දිළිඳුකම අවම කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනයේ කාර්යභාරය පිළිබඳව යෝජනා ඉදිරිපත් කර ඇත. එහිදී එළඹී ඇති නිගමන ගණනාවකි.

අධ්‍යයනයට ලක්කල සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ජනගහන වර්ධන වේගයේ අඩු වීමක් පෙන්නුම් කර ඇත. පෞද්ගලික අංශයේ කාර්මික හෝ සංවිධාන හෝ ආයතනික හෝ වර්ධනයක් ග්‍රාමීය ප්‍රදේශවල දැකිය නොහැකිය ග්‍රාමීය ශ්‍රමය අපතේ යයි. ශ්‍රමිකයන් සඳහා රැකියා නොමැත. දිළිඳු ගැමි ජනතාව
යැපීම් මානසිකත්වයක සිරකර තබා ඇත. මව්වරු විදේශගතවීම් අධිකය. පියවරුන්ගෙන් සියයට 60 ක් පමණ මත්පැන් පානය කරති.ග්‍රාමීය පවුල් තම පවුලේ සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ දක්වන්නේ අඩු සැලකිල්ලකි. ඉඩම් අයිතිය නීත්‍යානුකූලව නොමැති අතර, අද ගොවීන් වශයෙන් සියයට 30 ක් පමණ ශ්‍රමය වැය කරති. දෙමාපිය දිළිඳුකම නිසා දරුවන්ගේ අධ්‍යාපනය අතරමග නැවතී ඇත. ණය බරින් පීඩිත වී සිටින විශාල ජනගහනයක් දැකිය හැකිය. විකල්ප ආදායම් මාර්ග ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත වී නැත. කාර්මික අංශය නොදියුණුය. යටිතල පහසුකම් වලින් ඇත්තේ අවශ්‍යතාවයෙන් සියයට 15 ක් පමණි. ග්‍රාමීය කාන්තාව ගෙදරවැඩ, දරුවන් හදාවඩාගැනීම හා ගොවිතැන් වැඩ මෙන්ම විවිධ ඉපයීම් කාර්යයන්හිද නිරත වී සිටී. පවුල් වලින් සියයට 40 ක් පමණ රාත්‍රී ආහාර නොගන්නා අතර; සියයට 32 ක් පමණ උදෑසන ආහාරද නොගනී. කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජල පහසුකම් නැත. අස්වැන්න අලවිකර ගැනීමේ පහසුකම්ද නැත. දරුවන් විසින් ගොවිතැන අත්හැර දමා තිබේ. ගමනාගමන පහසුකම් අවම මට්ටමේ පවතින ග්‍රාමීය ප්‍රදේශවල ජනගහනයෙන් සියයට 65 ක ගේ වාහනය වී ඇත්තේ පා පැදියයි. රාජ්‍ය නොවන සංවිධාන විවිධ දරිද්‍රතා ලක්‍ෂණ හඳුනාගෙන ඇති අතර; එම ගැටළු අවම කිරීම සඳහා මූල්‍ය, ද්‍රව්‍ය හා උපදේශාත්මක ආධාර ලබා දී ඇත. බොහෝ පවුල් උපයන ආදායමින් සියයට 95 ත් පමණ වැය කරනු ලබන්නේ ආහාරය සඳහාය. දෙමාපිය සාක්‍ෂරතාව දුර්වල අතර; සියයට 28 ක් කිසිදාක පාසල් ගොස් නැත. තවත් සියයට 50 ක් පමණ අධ්‍යාපනය ලබා ඇත්තේ ප්‍රාථමික මට්ටමට පමණි. ගම්වාසීන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීම සඳහා සියයට 65 ක් පමණ විශ්වාසය තබා ඇත්තේ සීට්ටු දැමීම, මුදල්

පොලියට ගැනීම, වත්කම් උකස් කිරීම, වෙළෙඳපල ණය ගැනීම් වැනි අවිධිමත් මූල්‍ය මාර්ග කෙරෙහිය.

ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තව ඇත්තේ අවම වශයෙනි. අධ්‍යයනයට ලක්කළ ග්‍රාමීය පාසල්වල ගුරු හිඟය බලපවත්වන අතර, භෞතික පහසුකම් නැත. දරුවන්ගේ පාසල් නොපැමිණීම්, අතරමගදී පාසල හැරයාම් අධිකය. ජාතික විභාග සමත් වන්නේ අවම වශයෙනි. පාසල් යායුතු වයසේ නොයන දරුවන් ප්‍රතිශතය සියයට 12 ක් පමණ වේ. 1998 වර්ෂයෙන් පසු නොවිධිමත් අධ්‍යාපනය කෙරේද දක්වන්නේ අඩු සැලකිල්ලකි. ගොවිතැන් කාලයට ග්‍රාමීය පාසල්වල ශිෂ්‍ය පැමිණීම සියයට 35 දක්වා පහළ බසී. බාල දරුවන් රැකබලාගැනීම, ගොවිතැනට උදව්වීම, ඉපයීම් කටයුතු වලට යොමු වීම. මව විදේශගත වීම වැනි හේතු නිසා දරුවන් පාසල් අධ්‍යාපනයෙන් ගිලිහී ඇත. පාසලට දින පතා ශිෂ්‍ය නොපැමිණීම් අධික වන අතර උදෑසන ආහාර නොමැති වීම, පාසල් උපකරණ නොමැති වීම, ඊට හේතු වී ඇත. දරුවන් පිළිබඳ දෙමාපිය අපේක්ෂණ ප්‍රාථමික මට්ටමේ පවතී. සියයට 70 ක් පමණ දෙමාපියන් තුල දරුවන් පිළිබඳ අනාගත අපේක්ෂාවන් නැත. දරුවන්ගෙන් අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍යපෙළ හෝ ඉහළ අධ්‍යාපනයක් ලබා ඇත්තේ සියයට 20 ක් පමණි. තම දරුවෝ පිළිබඳ විමසීමට දෙමාපියන්ගෙන් සියයට 10 ක් පමණ පාසලට යති. නිවසේදී දරුවන්ගේ පොත්පත් පරීක්ෂා කරනු ලබන්නේ දෙමාපියන්ගෙන් සියයට 20 ක් පමණි.

දෙමාපියන් දිළිඳු නිසා ග්‍රාමීය පාසලට තම දරුවන් යවයි. ග්‍රාමීය පාසල අවම සම්පත් හා පහසුකම් යටතේ ක්‍රියාත්මක වීමෙන් අධ්‍යාපනය නීරස ව්‍යායාමයක් වී තිබේ. ඉන් පසු දරුවන් පාසලින් ගිලිහීමත්, විෂමාචාර වලට යොමු වීමත්, විරැකියාවෙන් පෙළීමත් හේතු කොටගෙන, පරම්පරාගත දරිද්‍රතාවක් උරුම වී ඇත. 'දිළිඳුකම'; ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රකට ලක්ෂණයකි. දිළිඳුකමේ ආදීනව ඉහළම මට්ටමේ සිට පහලටම ගලාගොස් අවසානයේදී දිළිඳුකමේ ගැලී සිටින ගැමියන් පීඩාවට පත් කර ඇත. දැඩි භෞතික හා මානව සම්පත් හිඟයකට මුහුණ පා ඇති ග්‍රාමීය පාසලද දරිද්‍රතාව පරම්පරා ගතව පවත්වාගෙන යාමට බෙහෙවින්ම උදව් කරනු ලබන බව පෙනේ.